**වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**
**-----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 30 දින විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් 31 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-------------------------------------------**

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**--------------------------**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

**(ආ) ගිණුම්කරණ අඩුපාඩු**
**--------------------------**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාව සතු ඉඩම් 55 ක් වටිනාකම තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණි. | වත්කම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| (ii) | වාහන 03 ක් සඳහා වටිනාකම තක්සේරු කර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් නොකිරීමෙන් මෝටර් රථ හා වාහනවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දැක්වුණි. | වාහනවල වටිනාකම තක්සේරු කර පොත්වල දැක්විය යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය | වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කෙරේ. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 158 වගන්තිය | රු519,328 ක් වටිනා හිඟ වරිපනම් බදු ගෙවීම පැහැර හැරි පුද්ගලයන්ට සභාපතිවරයා විසින් වරෙන්තු නිකුත් කර නොතිබුණි. | අදාළ පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කරමින් පවතී. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | කොන්ත්‍රාත්කරුවන්ට ආපසු ගෙවිය යුතු ඇප මුදල් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | නියමිත මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ඇප මුදල් රු.474,473 ක් ලබාදීමට කටයුතු කර ඇත. |
| (ඈ) | 2017 මාර්තු 07 දිනැති අංක PE/01/2017උතුරු පළාත් මූල්‍ය චක්‍ර ලේඛය | ඇප මුදල් ගෙවිය යුතු අය විසින් ඒවා ගෙවා නොතිබුණි. | අදාළ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඇප මුදල් අයකිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඉ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍ර ලේඛය | සභාවේ වාහන 10ක් සඳහා සමාලෝචිත වර්ෂයේ ඉන්ධන පරිභෝජන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | අදාළ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදාළ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

### 1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව ඇතැම් ඉඩම් විකුණුම් මත 1% ක විකුණුම් බදු අයකළ යුතු වුවත් සභාව විසින් ඒවා අයකිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වේ. | ඉඩම් වෙන්දේසි සිදුවන අවස්ථාවේදී 1% ක විකුණුම් බදු අයකිරීමට කටයුතු කරනු ලැබේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 44,440,060 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 28,387,663 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 98,100 | - | 226,795 | 519,328 | 101,800 | - | 83,786 | 645,129 |
| කුලී | 10,326,600 | - | 11,713,343 | 30,250 | 3,542,800 | - | 4,805,857 | 5,000 |
| බලපත්‍ර ගාස්තු | 1,620,300 | - | 2,134,165 | - | 1,627,900 | - | 1,452,349 | - |
| වෙනත් ආදායම් | 96,030,400 | - | 71,992,688 | 5,4725,678 | 28,575,700 | - | 68,911,316 | 31,000 |
| එකතුව | 108,075,400 | - | 86,066,991 | 55,275,256 | 33,848,200 | - | 75,253,308 | 681,129 |

* බිල් කළ ආදායම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.2** ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ රැස්කළ ආදායම රු.75,253,308 ක් වුවත්, 2018 වර්ෂයේ රැස්කළ ආදායම රු.86,066,991 කින් වැඩි වීමෙන් 2017 වර්ෂය සමඟ සැසඳීමේදී 2018 වර්ෂයේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය රු.10,813,683 කින් වැඩි වී තිබුණි. | බිල් කළ ආදායම් තහවුරු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| (ආ) | සභාව විසින් වර්ෂයකට අධික කාලයක සිට ආදායම් බිල් නොකිරීමෙන් අදාළ ආදායම් රැස්කිරීමේ ඵලදායිතාවය තහවුරු කරගත නොහැකි වී තිබුණි. | සභාවේ ආදායම් බිල් කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

**2.2.3** වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ වරිපනම් බදු ලේඛනය ප්‍රකාරව සභාවේ හිඟ වරිපනම් බදු රු.469,742 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | හිඟ හිටි මුදල් නියමිත කාලයේදී අයකර ගත යුතු වේ. | ඉතිරි මුදල් රු.469,742 ක් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කෙරෙමින් පවතී. |

**2.2.4** උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු

**(අ)** උසාවි දඩ මුදල්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් රු2,749,012 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ මුදල් ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | දඩ මුදල් අයකිරීමට කටයුතු කෙරේ. |

**(ආ) මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු රු.10,213,959 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ මුදල් ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | මුද්දර ගාස්තු අයකිරීමට කටයුතු කෙරේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව මූලික කරුණු 30ක් පිළිබඳව අතුරු ව්‍යවස්ථා කර තිබුණත් එම සියලුම මූලික කරුණු ක්‍රියාත්මක කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක සකස් කළ යුතු වේ. | ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත. |

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනවා තිබූ උප රීතීන් ප්‍රකාරව සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 30 ක් සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක සකස් කළ යුතු වේ. | ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත. |

(ඇ) **මූල්‍ය ප්‍රතිපාදන සලසා නොතිබීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සකස් කළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 24 කින් ක්‍රියාකාරකම් 13 ක් සඳහා පමණක් වාර්ෂික අයවැය ප්‍රතිපාදන සලසා තිබූ අතර රු.33,000,000 ක් වටිනා ක්‍රියාකාරකම් 11 ක් ක්‍රියාත්මක කළ නොහැකි විය. | ලැබෙන ප්‍රතිපාදන අනුව වැඩසටහන් සකස් කළ යුතු වේ. | මෙම වැඩසටහන්වලින් 12 ක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. |

(ඈ) **අතහැර තිබූ ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ව්‍යාපෘති දෙකක මෙහෙයුම් ආරම්භ කිරීමට රු.10,262,245ක් වැය කර තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් අපේක්ෂා කළ ප්‍රතිඵල ළඟා කර නොගෙන එකී ව්‍යාපෘති අතහැර දමා තිබුණි. | කුමන අරමුණක් සඳහා ව්‍යාපෘති ආරම්භ කළේද එම අරමුණු ඉටු කිරීම සඳහා කටයුතු කළ යුතුවේ. | සාතකාගාරය සහ මල අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කෙරෙමින් පවතී. |

(ඉ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | කීරිමලෙයි හි ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා වෙන්කළ ප්‍රදේශයේ දෛනිකව රැස් කෙරෙන අපද්‍රව්‍ය කැබැලි කර පස්වලින් වසා නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය කැබැලි කර පරිසරයට බලපෑම් නොවන පරිදි පස් දමා වැසිය යුතු වේ. | කසළ කැබලි කර පස් දැමීම සඳහා අප සභාව විසින් කටයුතු කර ඇත. |
| (ii) | ජාතික ප්‍රතිපත්තිය අනුව ඝන අපද්‍රව්‍ය වෙන් නොකර රැස්කරනු ලැබේ. | ඝන අපද්‍රව්‍ය වෙන්කර එකතු කළ යුතු වේ. | ඝන අපද්‍රව්‍ය වෙන්කර බැහැර කිරීමට කටයුතු කඩිනමින් කටයුතු කෙරේ. |

(ඊ) පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තෝරාගෙන තිබූ ප්‍රදේශයේ මැසි මදුරුවන් බෝවීම මර්ධනය සඳහා මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නියමිත ක්‍රියාමාර්ග සිදු කළ යුතු වේ. | ක්‍රියාමාර්ගයන් ගනිමින් පවතී. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවට අයත් කන්කසන්තුරෙයි, මයිලිට්ටි ආදී උප කාර්යාලවලට අදාළ දේපල නැවත තක්සේරු කර තිබුණත් වරිපනම් බදු ලේඛනය නඩත්තු කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාව විසින් වරිපනම් බදු ලේඛන නිසි පරිදි නඩත්තු කළ යුතු වේ. | ඇතැම් උප කාර්යාලවලට අයත් දේපල අවසන් නැවත තක්සේරු කිරීම් අවසන් අදියරේ පවතී. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් මානව සම්පත් ලබාගෙන යොදවා නොතිබූ බැවින්, එවැනි මානව සම්පත් 04 ක් විසින් නිම කළයුතු කාර්යයන් ප්‍රමාදවී තිබූ බව නිරීක්ෂණය විය. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | අදාළ ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවට අයත් රෝලරය වැනි වාහන ආදායම් ඉපැයීම් සඳහා භාවිතා කළ ද එමඟින් ලබාගත් ආදායමට වඩා වියදම් අධික වී තිබුණි. | සභාවේ වත්කම් ඵලදායී ලෙස භාවිතා කිරීම තහවුරු කළ යුතු වේ. | ප්‍රාදේශීය සභා මාර්ගවල ඇති කැලෑ පිරිසිදු කිරීමට මෙම වාහනය භාවිතා කෙරුණි. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.7,836,360 ක් වටිනා වාහන 05 ක් සභාවේ නමට අයිතිය මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාවේ නමට අයිතිය මාරු කිරීමට කටයුතු කළ යුතු වේ. | වාහනවල අයිතිය මාරු කිරීමට කටයුතු කර ඇත. |

### 3.5.2 නිෂ්කාර්ය වත්කම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාහන 02 ක් භාවිතයට නුසුදුසු තත්ත්වයේ පැවතුණි. | වාහන නියමිත පරිදි නඩත්තු කිරීම් සඳහා කටයුතු කළ යුතු වේ. | ලිපි ලේඛන නොමැති වාහන සම්බන්ධයෙන් අවසන් ක්‍රියාමාර්ග කිසිවක් කළ නොහැකි වී තිබුණි. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ සේවක වැටුප්, ගමන් වියදම්, මූලධන වත්කම් අලුත්වැඩියා සහ නඩත්තුව, පොළී ගෙවීම්, කොටස් ලාභ, සහනාධාර, විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂික වැනි වියදම් හිතකරවත් භාණ්ඩ හා අවශ්‍යතා, පැටවුම් හා ගොඩබෑම් සන්නිවේදන සම්බන්ධතා සේවාවන් සහ වෙනත් වියදම් අහිතකරවත් පැවතුණි. | අයවැය නිවැරදි අයුරින් සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |